316

RARE

# බෞද්ධ අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රතිවේදය පහළ කිරීම සඳහා උපමා භාවිත කර ඇති ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයකි.

නිරල්ගම බුද්ධවංස හිමි


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 316 |
| වර්ග අංකය | |


කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ
බෞද්ධ අධ්‍යයන පිළිබඳ දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී

2003 අප්‍රියෙල්

# හැඳින්වීම

'බෞද්ධ අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රතිවේදය පහළ කිරීම සඳහා උපමා භාවිත කර ඇති ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයකි' යන ප්‍රධාන මාතෘකාව යටතේ පරිච්ඡේද පහකින් යුතු ව සම්පාදනය කළ මෙම පර්යේෂණ නිබන්ධය බෞද්ධ ඉගැන්වීම් ක්‍රමයේ දී උපමා කථනයට කවර තැනක් හිමි වී ඇත් ද යන්න විමර්ශනය කිරීමත්, ත්‍රිපිටකයේ අන්තර්ගත උපමා පිළිබඳ ව පාඨක අවධානය යොමු කරවීමත්, ඉගැන්වීමේ කාර්යයේ දී උපමාව වහල් කර ගත හැකි ආකාරය පිළිබඳ කොරතුරු අනාවරණය කිරීමත් යන අරමුණු මුල් කොට ගෙන රචනා කරන ලද්දකි. ත්‍රිපිටකයේ දක්වෙන උපමා පිළිබඳ ව ගැඹුරින් අදහස් දක්වමින් රචිත ග්‍රන්ථයක් දක්නට නො ලැබුණි. ඕපනායක ජිනරතන හිමියන් විසින් රචිත 'ධර්මෝපමා' නමැති ග්‍රන්ථය හා රීස් ඩේවිඩ්ස් මහතා විසින් රචිත 'Semilies in the Nikayas' නමැති ග්‍රන්ථය මෙම විෂයය යටතේ ලියැවුණු ග්‍රන්ථ දෙකකි. ඒවායේ ද ත්‍රිපිටක උපමා පිළිබඳ සතුටුදායක අර්ථවිග්‍රහයක් දක්නට නො ලැබේ. ඊට අමතර ව යම් යම් කුඩා ලේඛන බිහි වී ඇතත් ඒවායින් මෙබඳු පර්යේෂණයකට කිසියම් හෝ පිටුවහලක් ලබා ගැනීම දුෂ්කර ය. මෙම අඩුපාඩුව සැලකිල්ලට ගෙන මවිසින් මාගේ ශක්ති ප්‍රමාණයෙන් සම්පාදනය කරන ලද මෙම පර්යේෂණ නිබන්ධය ඒ අඩුපාඩුව තරමක් දුරට හෝ සම්පූර්ණ කිරීමට සමත් වනු ඇතැ'යි විශ්වාස කරමි.

විවිධ බුද්ධිමට්ටම්වලින් යුත් පුද්ගලයන්ට දහම් දෙසීමේ දී ඒ ඒ පුද්ගලයන්ට විෂය වන විවිධ ක්‍රම ශිල්ප බුදුරජාණන් වහන්සේ විසින් අනුගමනය කරන ලද බව ත්‍රිපිටක ග්‍රන්ථවලින් හෙළි වෙයි. ගුරුවරයෙකු ලෙසත්, ශාස්තෘවරයෙකු ලෙසත් ශ්‍රාවකයන්ට දහම් අවබෝධ කරවීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් උපයෝගී කර ගන්නා ලද ඉගැන්වීම් ක්‍රම ශිල්ප අතර උපමා කථනයට මුල් තැනක් ලැබී ඇත. ඉගැන්වීමේ ක්‍රම ශිල්ප ගැන කථා කරන බොහෝ දෙනෙකුගේ අවධානය යොමු වී ඇත්තේ බටහිර අධ්‍යාපනඥයන් විසින් ගොඩනගන ලද සිද්ධාන්ත කෙරෙහි ය. වසර දෙදහස් පන්සිය ගණනකට පෙර විසූ ගෞතම බුදුරජාණන් වහන්සේත්, උන්වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේත් විසින් අර්ථාවබෝධය සඳහා පාදක කර ගන්නා ලද මෙම ඉගැන්වීම් ක්‍රමය නූතන ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ද උපයෝගී කර ගන්නේ නම් ඉන් සාර්ථක ප්‍රතිඵල අත් කර ගත හැකි වනු ඇත.

මෙහි පළමු පරිච්ඡේදය වෙන් කොට ඇත්තේ බුදුරදුන් පහළවීමට පෙර පැවති ආගමික සම්ප්‍රදායයන්හි ඉගැන්වීමේ කාර්යය සඳහා උපමා සම්බන්ධ කර ගෙන ඇති ආකාරය විමසා බැලීම පිණිස ය. මේ පිළිබඳ ව තොරතුරු විමර්ශනය කිරීමේ දී ගැටලු මතු විය. ප්‍රධාන ගැටලුවක් වූයේ බ්‍රාහ්මණ හා ජෛන යන ආගමික ඉගැන්වීම්වල එන උපමා අධ්‍යයනය කිරීම යි. එබඳු ආගමික ඉගැන්වීම්වල එන උපමා ප්‍රයෝග පිළිබඳ ව කෙටි විග්‍රහයක් කර නිහඬ වීමට සිදු විය. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුත්තක් ඇත. එනම්, ඉන්දු නිම්න අවදියේ පටන් බුද්ධ කාලය දක්වා පැවති සෑම ආගමික සම්ප්‍රදායක ම දක්වෙන උපමා විග්‍රහ කිරීම මෙබඳු කාර්යයක දී කළ නොහැකි බැවින් තෝරාගත් ආගමික ග්‍රන්ථ කීපයක දක්වෙන උපමා පමණක් විමර්ශනය කිරීමට සිදුවීම යි.

උපමාව හා එහි විවිධ ප්‍රභේද යනුවෙන් නම් කර ඇති දෙවන පරිච්ඡේදයේ මුල් කොටස තුළින් උපමාව හා ඒ සම්බන්ධ තොරතුරු පොදුවේ අනාවරණය කිරීමට වෑයම් කර ඇත. ඉන් අනතුරු ව බුදුරජාණන් වහන්සේ ඇතුළු සෙසු ශ්‍රාවක පිරිස් විසින් බෞද්ධ උපමා කථන ක්‍රමය හැඩ ගස්වනු ලැබ ඇති ආකාරය හඳුනා ගැනීමට ඉවහල් වන ක්‍රම ශිල්ප කීපයක් පිළිබඳ සංක්ෂිප්ත විවරණයක් ඇතුළත් කොට තිබේ. මෙම පරිච්ඡේදය අවසානයේ උපමා කථන ක්‍රම ශිල්ප ගණනාවක් සම්බන්ධ තොරතුරු ද ඇතුළත් වේ. ඒවා නම් කර ඇත්තේ මාගේ ම ස්වාධීන අර්ථවිග්‍රහයන්ට අනුකූල වන පරිද්දෙනි.

තෙවන පරිච්ඡේදය තුළින් බුදුරජාණන් වහන්සේත්, සෙසු අනුගාමික ශ්‍රාවක පිරිස් විසිනුත් අර්ථය පැහැදිලි කිරීම පිණිස විවිධ අවස්ථාවල දී උපයෝගී කර ගෙන ඇති ත්‍රිපිටක උපමා පිළිබඳ පොදුවේ කරුණු විස්තර වෙයි. සූත්‍ර, විනය, අභිධර්ම යනුවෙන් තුන් කොටසකට බෙදු ඇති ත්‍රිපිටකයේ එන සියලු ම උපමා උපුටා දක්වමින් විග්‍රහ කිරීම කිසි සේත් කළ නොහැකි බැවින් ත්‍රිපිටකය නියෝජනය වන පරිදි තෝරා ගත් ග්‍රන්ථ හා සූත්‍ර කීපයක දක්වෙන උපමා විමර්ශනයට ලක් කර ඇත. මෙහි උප ශීර්ෂ බෙදා වෙන් කර ඇත්තේ ද ත්‍රිපිටකය නියෝජනය වන අයුරිනි. ත්‍රිපිටක ග්‍රන්ථ අතර සූත්‍ර පිටකයේ උපමා වැඩි ම ප්‍රමාණයක් අන්තර්ගත වන බැවින් 'සූත්‍ර පිටකාගත උපමා' යනුවෙන් මෙහි නම් කර ඇති කොටස සෙසු කොටස්වලට වඩා ප්‍රමාණයෙන් විශාල විය. විනය හා අභිධර්ම යන පිටකයන්හි එන උපමා සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීමට සිදු වූයේ ඒවායේ උපමා විරල බැවිනි. පරිච්ඡේදය අවසානයේ ත්‍රිපිටකයේ එන දෘෂ්ටාන්ත කථා වෙන ම උප ශීර්ෂයක් යටතේ දක්වා ඇත්තේ ඒ කෙරෙහි පාඨක අවධානය විශේෂයෙන් යොමු කිරීමේ අපේක්ෂාවෙනි.

සතර වන පරිච්ඡේදය වෙන් කර ඇත්තේ බෞද්ධ උපමා කථන ක්‍රමය ශ්‍රාවක ප්‍රතිවේද දැනුම වැඩි දියුණු කිරීම සඳහා උපකාරී වූ ආකාරය පිළිබඳ අතිරේක කරුණු ස්වල්පයක් සාකච්ඡා කිරීමේ අරමුණ ඇති ව ය. නූතන ඇතැම් ඉගැන්වීම් ක්‍රමවල එන ප්‍රධාන අංග ලක්ෂණ කීපයක් බෞද්ධ උපමා කථන ක්‍රමය තුළින් දර්ශනය වන ආකාරය පෙන්වා දීමට මෙහි අවසාන භාගය වෙන් කර ඇත. බෞද්ධ උපමා කථන ක්‍රමයේ දී බුදුරජාණන් වහන්සේ විසින් ද සෙසු ශ්‍රාවකයන් වහන්සේලා විසින් ද උපමා කථනය සඳහා පාදක කර ගන්නා ලද තත්කාලීන භාරතීය සමාජ අත්දැකීම් අනාවරණය කිරීම පිණිස මෙහි පස් වන පරිච්ඡේදය වෙන් කෙරිණි. මෙහි දී තත්කාලීන පොදු ජන ජීවිත අත්දැකීම් හා විවිධ කර්මාන්ත සුවිශේෂ ධනෝපායන ක්‍රම ඇසුරින් ලබා ඇති අත්දැකීම් වෙන් වෙන් වශයෙන් විග්‍රහ කර දැක්වීමට උත්සාහ දරා ඇත්තේ ඓතිහාසික තොරතුරු ද අනාවරණය වන පරිද්දෙනි.

මෙම පර්යේෂණය මඟින් අනාවරණය කර ගත් කරුණු කාරණා පදනම් කොට ගෙන ලබා ගත් නිගමන ඇතුළත් උප ශීර්ෂයක් 'නිගමනය' නමින් ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව එක් එක් පරිච්ඡේදයන්හි දැක්වෙන අතිරේක කරුණු පැහැදිලි කිරීමේ අරමුණින් උප ග්‍රන්ථයක් ද එක් කිරීමට කටයුතු යෙදීමි.

මෙම පර්යේෂණ නිබන්ධය රචනා කිරීමේ දී හැකිතාක් දුරට සම්මත ලේඛන රීතීන් අනුගමනය කිරීමට උත්සාහ දරා ඇතත් සිංහල භාෂාවේ අක්ෂර වින්‍යාසය හා පද බෙදීම පිළිබඳ විවිධ මතභේද පවතින හෙයින් අක්ෂර වින්‍යාසය සම්බන්ධ ගැටලු මතු වූ තන්හි ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ නිර්දේශිත ක්‍රම විධි අනුගමනය කළෙමි. පද බෙදීම සිදු කර ඇත්තේ නාම, ක්‍රියා, නිපාත, විශේෂණ වෙන් කොට දැක්වීමේ සුවිශේෂ පිළිවෙළකට අනුව ය. මෙහි දී ශ්‍රී සුමංගල ශබ්දකෝෂ සංස්කාපනයේ පද බෙදූ ඇති ආකාරය හා ජාතික අධ්‍යාපන ආයතනයේ නිර්දේශිත පද බෙදීමේ ක්‍රමය සැලකිල්ලට ගෙන ඇත. අර්ථය විකෘති වේයැ'යි හැඟෙන තැන්වල දී හැර සෙසු සෑම තැනක දී ම විශේෂණ පද වෙන් කොට දක්වා තිබේ. 'නො' නිපාතය වෙන් කොට දක්වා ඇත්තේ ක්‍රියා පදයක් හා සම්බන්ධ වන අවස්ථාවල දී පමණි.

උද්ධෘත පාඨ දැක්වීමේ දී (" ") යන ලකුණ ද, පදයක්, වාක්‍යයක් හෝ වාක්‍යාංශයක් විශේෂ කොට දැක්වීමේ දී හා ප්‍රකෘති කථනය දැක්වීමේ දී (' ') ලකුණ යොදා ඇත. පාඨකයාගේ විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂිත උද්ධෘත නිදර්ශන පාඨ පමණක් ඡේදයෙන් වෙන් කොට දක්වා ඇතත් නිදර්ශන පාඨ බහුල ව ඉදිරිපත් කිරීමට සිදු වූ බැවින් සෙසු උද්ධෘත නිදර්ශන පාඨ ඡේද තුළ ම ඇතුළත් කරන ලදී. මේ අනුව අලුත් අදහසක් දැක්වීමට අපේක්ෂා

කරන අවස්ථාවන්හි දීත්, නිදර්ශන උද්ධෘත පාඨ වෙන් කොට දක්වන තන්හි දීත් ඡේද වෙන් කොට දක්වා ඇත. එක් එක් පරිච්ඡේදවල දී එකිනෙකට වෙනස් කාරණා තහවුරු කිරීම සඳහා සමාන නිදර්ශන උද්ධෘත පාඨ යෙදීමට සිදු විය. එසේ නිදර්ශන උද්ධෘත පාඨ නැවත නැවත යෙදීමට සිදු වූ තැන්වල පුනරුක්තියක් සේ පෙනී ගිය ද එමගින් තහවුරු කර ඇත්තේ එකිනෙකට වෙනස් කරුණු බව සැලකිය යුතු ය.

සෑම පරිච්ඡේදයක් අවසානයේ ම එම පරිච්ඡේදය සම්බන්ධ පාදක සටහන් ලේඛනයක් ඇතුළත් වෙයි. එසේ වුව ද යම් දුර්විඥේය කරුණක් පැහැදිලි කිරීමට අවශ්‍ය වූ අවස්ථාවන්හි දී (*)ලකුණ භාවිත කරමින් එම පිටුවේ ම අධෝලිපියක් ලෙසින් අතිරේක සටහනක් ඉදිරිපත් කර ඇති බව සැලකුව මනා ය. මෙම පර්යේෂණයේ දී 'බෞද්ධ අධ්‍යාපන ක්‍රමය' යනුවෙන් අදහස් කර ඇත්තේ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් ද සෙසු ශ්‍රාවකයන් විසින් ද පරිභාවිත ථෙරවාදී ත්‍රිපිටක දේශනාව යි. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම ශිල්ප එහි අඩංගු වන බැවින් එසේ පොදුවේ සලකා ඇති බව ද සඳහන් කරමි. මෙම පර්යේෂණ කාර්යය සඳහා වෙනත් බාහිර ලේඛකයන් විසින් රචනා කරන ලද කිසිදු ග්‍රන්ථයක් උපකාර කොට ගෙන නැත. එහෙයින් මෙහි දැක්වෙන අර්ථ නිරූපණ සහ විග්‍රහයන් මාගේ ස්වාධීන අදහස් මත ගොඩ නගා ඇති බව ප්‍රකාශ කරමි.